# 18. අපි පල්ලි යමු



ඒ ඉරිදා අම්මාත් තාත්තාත් මල්ලීත් මමත් උදෙන් ම පල්ලියට ගියා. වෙනදා වාගේ අරුල් මල්ලීත් රාධා නංගීත් අපට එක් වුණා. අපි පල්ලියට ඇතුළු වී දණ නමස්කාර කළා. ගීතිකා කණ්ඩායම ලස්සනට ගීතිකා ගායනා කළා. අපිත් ගීතිකා ගායනයට එක් වුණා. පියතුමා පූජාව පටන් ගත්තා. **"අපි අපේ පව් පිළිගනිමු"** පියතුමා කිවුවා. අපි ජේසුතුමාට ආදරය කරපු නැති අවස්ථා අපට මතක් වුණා. අපි දුක් වුණා. අපට සමාවන්න කියා ජේසුතුමාට කීවා.

පියතුමා එදා බයිබලයෙන් කියෙව්වේ යහපත් සමරිතානුවරයාගේ කතාව. ඒක ලස්සන කතන්දරයක්. අපි හොඳින් අහගෙන හිටියා. ජේසුතුමාට ආදරේ අය කරුණාවන්ත විය යුතු බවත්, සමගියෙන් සිටිය යුතු බවත් පියතුමා කීවා.



ඉන් පසු චම්පි නංගී, සමන්මලී, රාධා නංගී සහ කසුන් පඬුරු පෙරහැරට සහභාගි වුණා.

ජේසුතුමා ඉගැන් වූ යාච්ඤාව හැමදෙනා ම දෑත් දිගු කර ගෙන කිව්වා. පියතුමා හැම දෙනාට ම සාමය පැතුවා. අපිත් ඔබට සාමය වේවා' කියා ළඟ සිටි අයට සාමය පැතුවා. වැඩිහිටි අය පියතුමාගෙන් ජේසු ලබා ගත්තා. පූජාව අවසානයේ පියතුමා යන්න සාමය ගෙන යන්න' කියා පවසා අප දිරිමත් කළා. දෙවි පියාට නමස්කාර කර අප පල්ලියෙන් එළියට ආවා.

ෂේන් අයියා සහ සූසන් නැන්දාත් පූජාවට ඇවිත් තිබුණා. අපි ඒ අය සමග ටික වේලාවක් සුවදුක් කතා කළා. ජෑන්ස් මාමා අසනීප බව දැන ගත්තේ එවිටයි.

අපි ඒ බව පියතුමාටත් පැවසුවා. එතුමා ජෑන්ස් මාමා බැලීමට ඔහුගේ නිවසට එන බව කීවා. සැමදෙනා ම පියතුමාට ජේසු පිහිටයි! කියා ආචාර කළා. පසු ව අපි ගෙවල් බලා ගියා.

**පැවරුම්**

1. පහතින් සඳහන් වගන්ති පාට වර්ග හතරකින් අභ්‍යාස පොතේ ලියා ගෙන කොටු කරන්න.
   1. අපි සැම ඉරිදා ම පල්ලියට යමු.
   2. අපි ගීතිකා ගායනා කරමු.
   3. අපි සමඟියෙන් සිටිමු.
   4. අපි සාමය පතුරමු.
2. ජේසුතුමාට ආදරේ අය කළ යුතු දේවල් දෙකක් ලියන්න.